# INSTITUTE OF CHEMISTRY CEYLON

The Professional Body of Chemists in Sri Lanka & a Government Approved Degree Awarding Institute

A Government approved Charity
(Founded 1971; Incorporated by Act of Parliament No.15 of 1972,
Successor to the Chemical Society of Ceylon, Founded 1941)

**Institute of Chemistry Ceylon - Malabe Campus**
152A, Nawa Pubudu Kreedangana Mawatha, IT Park,
Halbarawa, Malabe, Sri Lanka
Tel: 011 2863681, 2532614, 2053148

**Adamantane House**
341/22, Kotte Road, Welikada
Rajagiriya, Sri Lanka
Tel: 011 2861231, 2861653,
2870587

E-mail: ichemc@sltnet.lk Web: https://www.ichemc.ac.lk


ඔක්තෝබර් 30, 2026

විදුහල්පතිතුමනි,

මහත්මියනි/මහත්මයාණනි

**ශ්‍රී ලංකා ජාතික රසායන විද්‍යා ඔලිම්පියාඩ් (SLNChO) – 2027 සහ**
**38 වැනි සමස්ත ලංකා අන්තර් පාසල් රසායන විද්‍යා ප්‍රශ්න විචාරාත්මක තරගය (ISCQ) – 2027**

ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනය (IChemC) විසින් උසස් පෙළ විද්‍යා අංශයේ සිසුන් අතර රසායන විද්‍යා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා ජාතික රසායන විද්‍යා ඔලිම්පියාඩ් (SLNChO) සහ සමස්ත ලංකා අන්තර් පාසල් රසායන විද්‍යා ප්‍රශ්න විචාරාත්මක තරගය (ISCQ) වාර්ෂිකව පවත්වනු ලැබේ. 2027 ජාත්‍යන්තර රසායන විද්‍යා ඔලිම්පියාඩ් (IChO) සහ 2027 මෙන්ඩලීව් ජාත්‍යන්තර රසායන විද්‍යා ඔලිම්පියාඩ් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරන සිසුන් SLNChO හරහා තෝරාගනු ලබන අතර, අඛණ්ඩව 38 වැනි වරට පැවැත්වෙන ISCQ තරගයෙන් හොඳම දක්ෂතා දක්වන පාසල් කණ්ඩායම් හඳුනාගනු ලැබේ.

මෙම වසරේ සිට තරග දෙක සඳහාම සිසුන් සහ කණ්ඩායම් තෝරාගැනීම සඳහා එක් පොදු මූලික විභාගයක් පවත්වනු ලැබේ.

සෑම පාසලකටම සිසුන් හය දෙනෙකු දක්වා නොමිලේ නම් කළ හැකි අතර ඔවින්ට තරහ දෙකම සඳහා සහභාගී වියහැක. නම් කරන සිසුන් ජීව විද්‍යා හෝ භෞතික විද්‍යා අංශයෙන් අධ්‍යාපනය ලබන, දැනට 12 හෝ 13 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් විය යුතුය. පාසල් මගින් නම් කරන සිසුන් අමුණා ඇති අයදුම්පත්‍රයද සම්පූර්ණ කර, උසස් පෙළ අංශ ප්‍රධානියාගේ සහ විදුහල්පතිවරයාගේ සහතිකය ලබාගෙන තැපෑලෙන් එවිය යුතුය.

SLNChO සඳහා සහභාගී වීමට අමතර සිසුන්ට පෞද්ගලික අයදුම්කරුවන් ලෙසද අයදුම් කළ හැකිය. සියලුම පෞද්ගලික අයදුම්කරුවන් ලබා දී ඇති QR කේතය හරහා ප්‍රවේශ විය හැකි Google Form එක භාවිතයෙන් ලියාපදිංචි විය යුතුය.

විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවලින් පැවැත්වේ. එහිදී අ.පොෂ. උසස් පෙළ රසායන විද්‍යා විෂය නිර්දේශයේ 1 සිට 13 දක්වා ඒකකවලින් (6 සහ 10 ඒකක හැර) සහ සාමාන්‍ය රසායන විද්‍යාවෙන් ප්‍රධාන වශයෙන් ප්‍රශ්න ඇතුළත් වේ.

අයදුම්පත් 2026 නොවැම්බර් 30 දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය. මූලික විභාගය 2027 ජනවාරි මාසයේදී නම් කරන ලද විශ්වවිද්‍යාල විභාග මධ්‍යස්ථානවල පැවැත්වේ. නිශ්චිත දිනය සහ ස්ථානය ලියාපදිංචි වූ සිසුන්ට විද්‍යුත් තැපෑලෙන් දැනුම් දෙනු ලැබේ.

ඔබගේ පාසල මෙතෙක් ලබා දුන් සහභාගීත්වය පිළිබඳව අපි කෘතඥ වන අතර, මෙම වසරේද ඔබගේ සහයෝගය සහ දායකත්වය අපේක්ෂා කරමු.

වැඩිදුර තොරතුරු සඳහා (+94) 11 2861653 හෝ (+94) 11 2861231 ඔස්සේ ඉගැන්වීම් සහායකවරයා අමතන්න, නැතහොත් වැඩි විස්තර සඳහා අපගේ නිල වෙබ් අඩවි වෙත පිවිසෙන්න.

ස්තුතියි.

මෙයට විශ්වාසී,

මහාචාර්ය ඉරේෂිකා ද සිල්වා
සභාපතිනී
ශ්‍රී ලංකා රසායන විද්‍යා ඔලිම්පියාඩ් කමිටුව

ආචාර්ය චින්තක රත්නවීර
සභාපති/සමස්ත ලංකා අන්තර් පාසල් රසායන විද්‍යා ප්‍රශ්න විචාරාත්මක තරග කමිටුව

**1. සමස්ත ලංකා අන්තර් පාසල් රසායන විද්‍යා ප්‍රශ්න විචාරාත්මක තරගය (ISCQ)**

දෙවන වටය සඳහා හොඳම දක්ෂතා දැක්වූ පාසල් කණ්ඩායම් 15 තෝරාගනු ලැබේ. ඒ සඳහා සෑම පළාතකින්ම එක් කණ්ඩායමක් සහ ඉහළම ලකුණු ලබාගත් අමතර කණ්ඩායම් හයක් ඇතුළත් වේ. දෙවන වටය ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේදී පැවැත්වේ. ජයග්‍රාහී කණ්ඩායම් ආයතනයේ වාර්ෂික සැසිවලදී ඇගයීමට ලක් කෙරේ.
වෙබ් අඩවිය: Institute of Chemistry Ceylon

**2. ශ්‍රී ලංකා ජාතික රසායන විද්‍යා ඔලිම්පියාඩ් (NCOSL)**

ශ්‍රී ලංකා ජාතික රසායන විද්‍යා ඔලිම්පියාඩ්හි අරමුණ වන්නේ දක්ෂ රසායන විද්‍යා සිසුන් හඳුනාගෙන, 2027 ජාත්‍යන්තර රසායන විද්‍යා ඔලිම්පියාඩ් (IChO) සහ 2027 මෙන්ඩලීව් ජාත්‍යන්තර රසායන විද්‍යා ඔලිම්පියාඩ් සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරන ජාතික කණ්ඩායම් තෝරාගැනීමයි. SLNChO හි අවසන් වටය සඳහා හොඳම දක්ෂතා දැක්වූ සිසුන් 30–35 දෙනෙකු තෝරාගනු ලබන අතර, එයට න්‍යායාත්මක සහ ප්‍රායෝගික සැසි ඇතුළත් වේ. ජාත්‍යන්තර තරග සඳහා අවසන් කණ්ඩායම් තෝරාගැනීමට වැඩිදුර පුහුණුව සහ ඇගයීම් පැවැත්වේ. ජාතික මට්ටමේ ජයග්‍රාහකයන්ට පදක්කම්, සහතිකපත්, මුදල් ත්‍යාග සහ IChemC හි රසායන විද්‍යා උපාධියක් හැදෑරීම සඳහා ශිෂ්‍යත්ව පිරිනමනු ලැබේ.

වෙබ් අඩවිය: http://www.web.ichemc.edu.lk/cosl/

**<u>ලියාපදිංචි වීම සඳහා QR කේතය: පෞද්ගලික අයදුම්කරුවන් සඳහා පමණි</u>**

Google පෝරමයේ සබැඳිය:

https://docs.google.com/forms/d/e/1FAIpQLSdQ0scQndp5XMEkSoA3BdxlhAEIguo_d5gAaJhPDaZ9WtXymw/viewform?usp=header